## විවිධ දැ

### පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

#### පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබ 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළ කරන ලද්දා වූ ද, සබරගමුව පළාත් සභාව විසින් 1990 අගෝස්තු මස 16 වැනි දින සියවා සම්මත කර 1990.12.27 වැනි දින අංක 642/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළ කරන ලද්දා වූ ද, අංක 01 සිට 42 දක්වා වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වන දින සිට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ විශේෂ කොමසාරිස් වන මම 1991 අප්‍රේල් මස 29 වැනි දින අංක 58 දරන තීරණය යටතේ පිළිගන්නා ලදී.

ඇම්. බී. ඇම්. සෝමරත්න,<br>
විශේෂ කොමසාරිස්,<br>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

1991 අප්‍රේල් මස 29 වැනි දින,<br>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05–780

---

### පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

#### නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක කිරීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීමෙන් පසු එම ප්‍රදේශය තුළ නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත (268 වැනි අධිකාරිය) ක්‍රියාත්මක